# ආර්ථික සංවර්ධන ක්‍රියාවලියෙහි කෘෂි අංශයේ දායකත්වය

ඩබ්ලිව්. එම්.ඩී. එස්.වීරකෝන් [1]

**සංක්ෂේපය**

ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ දී කෘෂිකාර්මික අංශයෙන් ඉටු කරනු ලබන මෙහෙය අතිමහත්ය. ආර්ථික සංවර්ධනය සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන සැලැස්මේ දී කෘෂිකර්මාන්තය කෙරෙහි වැඩි විශ්වාසයක් තැබීමට සහ වෙනත් අංශවලට වඩා වැඩි සැලකිල්ලක් දැක්වීමටත් හේතුවන කරුණු කිහිපයක් වේ. රටක් සංවර්ධනය කිරීම සඳහා තිබෙන එකම මාර්ගය කෘෂිකාර්මික නිෂ්පාදන ඉහළ දැමීම යි. එමෙන්ම දියුණු රටවල පවතින දරිද්‍රතාවය පිළිබඳ දුෂ්ට චක්‍රයක් බිඳ දැමීමේ එක ම මාර්ගය එකී රටවල්සංවර්ධනය කිරීම බවත් පවසයි. කෘෂි අංශයට මුල් තැන දිය යුතු යැයි තර්ක කරන ආර්ථික විද්‍යාඥයින් වන්නේ සයිමන් කුස්නෙට් ඇතුළු පිරිසයි. ඔවුන් පවසන්නේ දියුණුවන රටවල ජාතික ආදායමින් 50% ක් පමණ ලැබෙන්නේ කෘෂිකාර්මික අංශයෙන් බවයි. මේ රටවල මුළු ජනගහනයෙන් 70% ක් පමණ කෘෂිකාර්මික අංශයේ නියුතු වෙතත් ''සයිමන් කුස්නෙට්'' නම් ආර්ථික විද්‍යාඥයා පවසන්නේ කෘෂිකාර්මික අංශය ආකාර 3 කින් ආර්ථික සංවර්ධනයට දායක වන බවයි. එනම් වෙළෙඳපොල දායකත්වය , සාධක දායකත්වය හා නිෂ්පාදන දායකත්වය වශයෙනි. මෙම ආකාර තුන මගින් කෘෂිකාර්මික අංශය ආර්ථික සංවර්ධනයට දායක වන ආකාරය මෙහි විස්තර කර ඇත. මේ සඳහා පොත්පත් , සඟරා, අන්තර්ජාල තොරතුරු වැනි ද්විතික දත්ත මූලාශ්‍ර භාවිතා කර ඇත.

**මුඛ්‍ය පද**- වෙළෙඳපල දායකත්වය, නිෂ්පාදන දායකත්වය, සාධක දායකත්වය

## හැඳින්වීම

කෘෂිකාර්මික අංශයෙන් රටක් සංවර්ධනය කරා යන ගමනේ දී දියුණු රටවල් සම්බන්ධයෙන් නම් තිබෙන ශ්‍රමය ප්‍රමාණවත් නොවන නිසා කෘෂිකර්මාන්ත නිෂ්පාදනයෙහි අලුත් ශිල්පීය ක්‍රම සහ යන්ත්‍ර සූත්‍ර යෙදවීමෙන් , කෘෂිකර්මාන්තයට යොදවා ඇති අතිරික්ත ශ්‍රමය කර්මාන්ත සංවර්ධනය සඳහා යොදාගත හැකි ය. ඌන සංවර්ධිත රටවල් ආර්ථික වශයෙන් සංවර්ධනය කිරිමේ දී කෘෂිකාර්මික අංශය හා කාර්මික අංශය යන අංශ දෙක ම දියුණු කරයි. රටක් කාර්මික කිරීම සඳහා තිබෙන එකම මාර්ගය කෘෂිකාර්මික නිෂ්පාදන ඉහළ දැමීමයි. නොදියුණු රටවල් බොහෝමයක මූලික කර්මාන්තය ලෙස සැලකෙන්නේ කෘෂිකර්මාන්තය යි. එමෙන් ම ජනගහනයෙන් වැඩි කොටසක් ජීවත් වන්නේ ද කෘෂිකාර්මික අංශයේ ය. මේ නිසා ජාතික සංවර්ධන සැලසුම් පිළියෙල කිරීමේදී කෘෂිකාර්මික අංශය කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු ය. ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ දී කාර්මික

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) ආර්ථික විද්‍යා දෙවන වසර, wmds1199@gmail.com

අංශයට මුල් තැනක් දිය යුතු බව ඒ.බී. පාර්ෂ්මන් යන ආර්ථික විද්‍යාඥයා පවසයි. ඔහු පවසන්නේ කාර්මික අංශයේ නියුක්ත ශ්‍රමිකයකුගේ ඵලදාවේ වටිනාකම කෘෂි අංශයේ නියුක්ත ශ්‍රමිකයකුගේ ඵලදාවේ වටිනාකමට වඩා ඉහළ බවයි. එමෙන් ම කාර්මික හා කෘෂිකාර්මික යන දෙඅංශය ම ආර්ථික සංවර්ධනයෙහිලා වැදගත් වන බව ආතර් ලුවිස්, රැග්නාර් නර්ක්ස් වැනි ආර්ථික විද්‍යාඥයින් පෙන්වා දෙයි.

මේ ආකාරයට රටක් සංවර්ධනයේ දී කෘෂිකාර්මික අංශයේ වැදගත්කම , කාර්මික අංශයේ වැදගත්කම හා ඒ අංශ දෙකෙහිම වැදගත්කම පිළිබඳ ඉහත පරිදි ආර්ථික විද්‍යාඥයින් අදහස් දක්වා ඇත. නමුත් මෙහිදී මෙම ලිපියෙන් ප්‍රකාශ කරනු ලබන්නේ ආර්ථික සංවර්ධනය උදෙසා කෘෂිකාර්මික අංශයේ දායකත්වය කෙසේ සිදු වන්නේ ද යන්න පිළිබඳව යි.

**ආර්ථික සංවර්ධනයෙහිලා කෘෂි අංශයේ දායකත්වය**

කෘෂිකාර්මික අංශය ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට කරනු ලබන දායකත්වය අති මහත්ය. මේ පිළිබඳව අදහස් දක්වන ''සයිමන් කුස්නෙට්'' නම් ආර්ථික විද්‍යාඥයා පවසන්නේ කෘෂිකාර්මික අංශය ආකාර තුනකින් ආර්ථික සංවර්ධනයට දායක වන බවයි.

1. වෙළෙඳපොල දායකත්වය

2. සාධක දායකත්වය

3. නිෂ්පාදන දායකත්වය යනුවෙනි

**වෙළෙඳපොල දායකත්වය**

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සලකා බලන විට කාර්මික අංශයේ දියුණුවට බලපාන ප්‍රධාන සංරෝධකයක් වී ඇත්තේ වෙළෙඳපොල කුඩා මට්ටමක පැවතීමයි. ශ්‍රී ලංකාවේ නිෂ්පාදන ක්‍රියාවලින් බොහෝමයක් සරල තාක්ෂණයක් මත පදනම්ව පැවතීම නිසා නිෂ්පාදන හා ඵලදායිතාව අඩු මට්ටමක පවතී. 1977 ට පෙර ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කල ආනයන ආදේශන ප්‍රතිපත්තිය අසාර්ථක වීම සඳහා බලපාන ලද ප්‍රධාන සංරෝධකයක් වී ඇත්තේ ශ්‍රී ලංකාවේ වෙළෙඳපල කුඩා මට්ටමක පැවතීම යි. නමුත් කෘෂිකාර්මික අංශයේ නිෂ්පාදන ඉහළ නැංවීමෙන් කෘෂිකාර්මික ආදායම ඉහල යන අතර මේ නිසා කාර්මික භාණ්ඩ සඳහා ඇති ඉල්ලුම ඉහල යන්නේය යන්න ආර්ථික විද්‍යාඥයින්ගේ තර්කය යි. ආතර් ලුවිස් දක්වන්නේ ග්‍රාමීය අංශයේ ආදායම ඉහළයාම කාර්මීකරණයට අනුබලයක් නොව බාධාවක් විය හැකි බවයි. කෘෂිකාර්මික අංශයේ ඒක පුද්ගල ඵලදාව ඉහළ යාම මගින් කාර්මික අංශයේ නියුක්තවුවන්ගේ ආදායම ඉහළ යයි. මේ නිසා කාර්මික අංශයේ නියුක්ත වූවන් කෘෂිකර්මයට සංක්‍රමණය වීම වැලැක්වීම සඳහා කෘෂිකාර්මිකයන්ගේ ආදායමට සාපේක්ෂව ඉහළ වැටුපක් ගෙවීමට සිදුවේ. වැටුප් ඉහළ කෘෂිකාර්මික අංශයේ ආයෝජනය කෙරෙහි බලපාන එකම සාධකය

ප්‍රාග්ධනය නොවන නිසා මෙම තර්කය සම්පූර්ණයෙන් ම පිළිගැනීම අපහසු ය. අවසාන භාණ්ඩ සඳහා ඇති ඉල්ලුම පිළිබඳව ද අවධානය යොමු කළ යුතු ය. ප්‍රාග්ධන සම්පාදනය ඉහළ නැංවීම සඳහා ඵලදායී ආයෝජන අවස්ථා තිබීමේ වැදගත්කම ''රැන්නාස් නර්ක්ස්''' විසින් පෙන්වා දෙන ලදී. කාර්මික නිෂ්පාදන සඳහා ඇති වෙළෙඳපල පුළුල් වීමත් සමග ලාභදායී ආයෝජනවලට මං පෑදෙයි.

කෘෂිකර්මයේ නියුතු රටවල් කාර්මික භාණ්ඩ සඳහා වෙළෙඳපොල පුළුල් කිරීමට නම් අනිවාර්යයෙන්ම කෘෂි අංශයේ ආදායම් මට්ටම ඉහළ නැංවිය යුතුය. වෙළෙඳපල පුළුල්විම නිසා කාර්මික භාණ්ඩ නිෂ්පාදනයේ ඉහළ යාමත් සමග ආර්ථිකයේ ව්‍යුහාත්මක වෙනස්කම් හටගනී. ලංකාවේ ජනගහනයෙන් 70% ක් කෘෂිකාර්මික අංශයේ නියුක්ත වේ. රටේ ප්‍රධාන ආර්ථික ක්‍රියාවලිය වනුයේ කෘෂිකර්මාන්තය යි. කෘෂි අංශයේ දියුණුවකින් තොර ආර්ථික සංවර්ධනයක් අපේක්ෂා කළ නොහැක.

කෘෂිකාර්මික අංශය සංවර්ධනය වීම තුළින් ආර්ථික අංශය සඳහා වෙළඳපල සපයා දීමක් ද කාර්මික අංශය සංවර්ධනය කිරීම තුළින් කෘෂිකාර්මික අංශය සඳහා වෙළෙඳපල සපයා දීමක් ද සිදුවේ. මෙසේ කෘෂිකාර්මික අංශය තුළින් වෙළෙඳපල සපයා දීම දෙආකාරයකින් සිදුවේ. එනම් කෘෂිකාර්මික අංශයේ ඵලදාව වැඩි වීම හේතු කොටගෙන එවැනි නිෂ්පාදකයින් තුළ කෘෂිකාර්මික හා කෘෂිකාර්මික නොවන භාණ්ඩ මිලදී ගැනීම සඳහා විශාල ඉල්ලුමක් ඇති වීම හේතු කොට ගෙන කෘෂිකාර්මික නිෂ්පාදන ප්‍රදේශවල විශාල වෙළඳපොල තත්වයන් වර්ධනය වීම නිසා ආර්ථික ක්‍රියාකාරිත්වයෙහි වර්ධනයක් සිදුවේ. එමෙන් ම කෘෂිකාර්මික ආදායම් ඉහළ යාමේ ප්‍රතිඵලයක් වශයෙන් කෘෂි නිෂ්පාදනයන් සාම්ප්‍රදායික තාක්ෂණය වෙනුවට නූතන තාක්ෂණය කෙරෙහි යොමුවීමේ ප්‍රවණතාවයක් දක්වන අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් කාර්මික නිෂ්පාදිත භාණ්ඩ සඳහා වෙළඳපොලක් බිහිවීමේ ප්‍රවණතාවක් ඇති වේ. තවද වෙළඳපොල පුළුල්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඇසුරුම් ක්‍රියාවලියේ හා භාණ්ඩ බෙදාහැරීමේ ක්‍රියාවලියේ පුළුල්වීමක් සිදුවේ. මේ ආකාරයට සමස්ත ආර්ථික කටයුතු වල පුළුල්වීමක් සිදුවේ.

**සාධක දායකත්වය**

සාධක දායකත්වය යනු කෘෂිකාර්මික අංශය දියුණු කිරීම තුළින් කාර්මික අංශයේ ප්‍රගතියට අවශ්‍ය ප්‍රාග්ධනය , ශ්‍රමය , අමුද්‍රව්‍ය යනාදිය ලබා දීමයි. එමෙන්ම ශ්‍රී ලංකාවේ කාර්මික සංවර්ධනය සඳහා බලපාන ප්‍රධාන සංරෝධකයක් වී ඇත්තේ ප්‍රාග්ධනය සපයා ගැනීම පිළිබඳ ප්‍රශ්නයයි. නමුත් එය ආර්ථික සංවර්ධනය සඳහා අවශ්‍ය මූලික සාධකයකි කාර්මික අංශයේ නිෂ්පාදන දියුණු කිරීම සඳහා සමාජ පිරිවැය සඳහා , සහ වෙනත් ඉදිකිරීම්, විදුලිය, ප්‍රවාහනය ආදී කටයුතු සඳහා විශාල ප්‍රාග්ධනයක් අවශ්‍ය වේ. ආර්ථික සංවර්ධනයත් සමඟ ආර්ථිකයේ ව්‍යුහාත්මක වෙනස්කම් ද හටගනී. ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වන රටවල ක්‍රම සම්පාදනයේ දී මුහුණපාන ප්‍රධාන ගැටලුවක් වන්නේ අවශ්‍ය ප්‍රාග්ධනය හිඟකමයි. ආර්ථික සංවර්ධනයේ මුල් අවස්ථාවේදී ජාතික නිෂ්පාදිතයෙන් වැඩි කොටසක් ලබා දෙනුයේ කෘෂිකර්මයෙනි. කෘෂිකාර්මික අංශයේ ඒක පුද්ගල පරිභෝජන මට්ටම ඒක පුද්ගල ඵලදායි මට්ටමට වඩා අඩු වේගයෙන් ඉහළ යන්නේ නම් කෘෂිකර්මයෙන්

නිපදවන අතිරික්තය ඉහළ යනු ඇත. මෙම අතිරික්ත ඵලදාව කෘෂි නොවන අංශයන්හි ප්‍රාග්ධන අවශ්‍යතා පිරිමැසීම සඳහා යොදාගත හැකිය. කෘෂිකාර්මික අංශයේ ඵලදාව ඉහල නැංගවීම සඳහා අවශ්‍ය මූලධනය සමහර විට මානුෂික ප්‍රාග්ධනය මගින් පිරිමසාගත හැකිය. එමෙන්ම නිෂ්පාදන ඵලදායිතාවයෙන් කෘෂිකර්මය ඉහළ නිෂ්පාදන මට්ටමක් ලබා ගැනීමට සහ එහි ප්‍රතිඵලයන් වශයෙන් ආහාර ද්‍රව්‍ය මිල  පහළ බැසීමක් සිදුවේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් ආහාර ද්‍රව්‍ය මිල පහළ බැසීමත් එම මිල පහළ බැසීමේ ප්‍රථිපලයක් වශයෙන් ව්‍යවසායකයන්ගේ මූර්ත ආදායම් මට්ටම ඉහළ යාමත් ඉතිරිකිරිමේ ඉහළ යාමත් හේතුකොට ගෙන විශේෂයෙන් නාගරික ව්‍යවසායකයන් අතර ප්‍රාග්ධන ඒකරාශීකරණයක් ඇතිවේ.

ඕනෑම රටක කෘෂිකාර්මික අංශය සංවර්ධනය කිරීමෙන් කාර්මික අංශයේ දියුණුවට අවශ්‍ය පූර්ව කොන්දේසි සපයාගත හැකි බව කෘෂි ආර්ථික විද්‍යාඥයින් පෙන්වා දී ඇත. ආර්ථික සංවර්ධනයේ දී කෘෂිකාර්මික අංශය සහ කාර්මික අංශය යන දෙඅංශයේම සංවර්ධනයක් සිදුවීම අවශ්‍ය වේ.

අනතුරුව ආර්ථික සංවර්ධනයෙහිලා කෘෂි අංශයේ දායකත්වය විග්‍රහ කරන විට දී සයිමන් කුස්නෙට් සාධක දායකත්වය යටතේ අමුද්‍රව්‍ය කර්මාන්ත අංශයට ලබා දෙන අයුරු විමසා බලමු. ඒ අනුව කෘෂි අංශය දියුණු කිරීම තුළින් කාර්මික අංශයේ සංවර්ධනයක් අත්කර ගනිමින් කෘෂි අංශයේ හා කාර්මික අංශයේ යන දෙඅංශයේම සංවර්ධනය අත්කර ගත හැකි ය. කෘෂි අමුද්‍රව්‍ය බොහෝ දුරට වාණිජ භෝගයන් ය. ඒවාට සංවිධානය වුත් කාර්යක්‍ෂම වූත් වෙළඳපලක් ඇත. එසේම කෘෂි අමුද්‍රව්‍යයන්ගේ සැපයුම් නම්‍යතාවය, ආහාර සැපයුම් නම්‍යතාවයට වඩා විශාලය. රබර්, දුම්කොළ , කෙඳි වර්ග, පොල් නිෂ්පාදන දව, උක්දඩු ආදිය ලංකාවේ කර්මාන්ත සඳහා වැදගත්වන අමුද්‍රව්‍ය කිහිපයකි. වැඩි වැඩියෙන් දේශිය අමුද්‍රව්‍ය භාවිත කරන ලෙස ශ්‍රී ලංකා රජය විසින් කර්මාන්තකරුවන්ගෙන් ඉල්ලා ඇති අතර දේශීය අමුද්‍රව්‍ය බහුල වශයෙන් පාවිච්චි කරන කර්මාන්ත සඳහා ප්‍රමුඛත්වය දීමේ වැඩපිළිවෙලක් ද රජය විසින් ක්‍රියාත්මක කරන ලදී.

කෘෂිකාර්මික අංශයෙන් කාර්මික  අංශයට ශ්‍රමය සැපයීමද සිදු කරනු ලබයි. ආතර් ලුවිස්ගේ ද්වි ආංශික ආකෘතියට අනුව ආර්ථිකයේ ගතික ධනවාදී අංශයට අවශ්‍ය ශ්‍රමය ලබා ගනුයේ කෘෂිකර්මයෙනි. ආර්ථික සංවර්ධනයට ශ්‍රමය දායක කිරීම කෘෂිකාර්මික හා කෘෂිකාර්මික නොවන අංශ මගින් සිදුවේ. කෘෂිකාර්මික අංශයෙන් කාර්මික සංවර්ධනය සඳහා ශ්‍රමය දායක වන ආකාරය ආතර් ලුවිස් විසින් 1954 දී " Economic Development with unlimited supplys of Labour" නැමැති ලිපියෙන් ඉදිරිපත් කරයි. මොහුගේ ද්වි ආංශික ආකෘතියට ප්‍රධාන වශයෙන් පදනම් වුයේ සංවර්ධනය වන රටවල සීඝ්‍ර ජන සංඛ්‍යා ප්‍රසාරණයවීම ත් සමඟ අතිරික්ත ශ්‍රම සැපයුම ත් ජනිත වන්නේ ය යන තර්කයයි. ඌන සංවර්ධිත රටවල පවතින අසීමිත ශ්‍රම සැපයුම ආතර් ලුවිස් මේ ආකාරයට දක්වයි. ''පවතින ප්‍රාග්ධනය හා ස්වභාවික සම්පත්වලට සාපේක්‍ෂව බලන විට සමහර රටවල කොයිතරම් අධික ජනගහනයක් පවතින්නේ ද යත් එම ආර්ථිකයන් හි ශ්‍රමිකයන් වැඩි කොටසකගේ ආන්තික ඵලදායීතාව  ඉතාමත් පහත් තත්ත්වයක, ශුන්‍ය තත්ත්වයක හෝ සමහර විට සෘණ

අගයක් ගත හැකිය. මේ අතිරික්ත ශ්‍රමය කෘෂිකර්මය තුළ පමණක් නොව ආර්ථිකයේ වෙනත් අංශ තුළ ද තිබිය හැකිය.

කෙසේනමුත් ආර්ථික සංවර්ධනයත් සමග කෘෂිකර්මයේ නියුතු ශ්‍රම ප්‍රමාණය ප්‍රතිශතයක් වශයෙන් අඩුවේ. කෘෂිකර්මයේ ඒක පුද්ගල ඵලදාව ඉහළයාම නිසා කෘෂි අංශයේ අතිරික්ත නිෂ්පාදනය ඉහළ යන අතර කෘෂි අංශයෙන් කාර්මික අංශයට මුදාහැරිය හැකි ශ්‍රමිකයන් ප්‍රමාණය ද ඉහළ යයි. කෘෂි අංශයේ ඒක පුද්ගල ඵලදාව ඉහළ නොයවා වුවද කෘෂි අංශයෙන් ඉවත් කළ හැකි ශ්‍රමිකයින් කොටසක් සිටින බව සමහර ආර්ථික විද්‍යාඥයින් පෙන්වති.

ශ්‍රී ලංකාවේ ඇතුළු දියුණුවන රටවල විශේෂයෙන්ම ආසියාතික රටවල ආහාර සඳහා ඇති ඉල්ලුම ඉහළයාමේ ප්‍රවණතාවයක් දක්නට ඇත. ජනගහනය වර්ධනය හා ආර්ථික සංවර්ධනයත් සමග ඉහළ යන ආදායම මෙම ආහාර ඉල්ලුම ඉහළ යාමට ප්‍රධාන වශයෙන් බලපායි. අවශ්‍ය තරම් ආහාර සැපයුමක් නැති නිසා මන්දපෝෂණය මෙම රටවල පොදුවේ දැකිය හැකි ලක්ෂණයකි. මේ නිසා මේ රටවල ආර්ථික සංවර්ධනය සඳහා ආහාර සැපයුම නැංවීම අත්‍යාවශ්‍ය දෙයකි. ආහාර ඉල්ලුමට බලපාන සාධක අතුරින් ජනගහනය ප්‍රධාන සාධකයකි. ලංකාවේ පාරිභෝගික වියදමෙන් 60% ක්ම වැඩියෙන් ආහාර වෙනුවෙන් වැය කරන අතර ආහාර මිල මට්ටම ඉහළයාම මුළු ආර්ථිකයෙහි ම උද්ධමනකාරී තත්වයකට තුඩු දෙයි. නමුත් වැඩිවන ජනගහනයට ආහාර සැපයීමට කෘෂිකර්මාන්තයට නොහැකිනම් එමගින් සංවර්ධනයට බාධා සිදුවිය හැකිය. එමෙන්ම ආහාර සඳහා ඇති ඉල්ලුම දියුණු රටවල් හා සසඳන විට නොදියුණු රටවල වැඩි නම්‍යතාවයකින් යුක්තය. එහෙයින් වැඩිවන ඒක පුද්ගල ආදායමකින් නියතයෙන්ම කෘෂිකාර්මික නිෂ්පාදන සම්බන්ධයෙන් වැඩි බලපෑමක් ඇති වනවා ඇත. ශ්‍රී ලංකාව ඇතුළු තෙවන ලෝකයේ රටවල් ආහාර ආනයනය කරයි ඒ නිසා විදේශ විනිමය සම්පත් මෙරටින් පිටතට ඇදීයයි. එය වළක්වාලීමට නම් ප්‍රමාණවත් තරම් දේශීය නිෂ්පාදනයන් ඇතිකළ යුතුය. මේ ආකාරයට ආර්ථික සංවර්ධන ක්‍රියාවලියෙහිලා කෘෂිකාර්මික අංශයෙන් වැදගත් මෙහෙයක් සිදු කරන බව ප්‍රකාශ කළ හැකිය.

**සමාලෝචනය**

ඉහත සඳහන් පරිදි රටක සංවර්ධන ක්‍රියාවලිය සඳහා කෘෂි අංශය අත්‍යවශ්‍ය වශයෙන් තිබිය යුතු අංශයක් වශයෙන් හැඳින්විය හැකිය. කෘෂි අංශය ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට දායක වන්නේ ඉහත සඳහන් ආකාරයන් මගින් පමණක් නොවේ. ඒ අනුව රාජ්‍ය ආදායම් වර්ධනය කර ගැනීමේ මගක් ලෙස ද කෘෂිකාර්මික අංශය වැදගත් වේ. එපමණක් නොව විදේශ විනිමය ඉපයීමට මගක් ලෙසත් කෘෂි අංශය වැදගත් වේ. තවද ගෙවුම් ශේෂ ප්‍රශ්නයට විසඳුමක් සෙවීමේ දී කෘෂිකාර්මික අංශය වැදගත් වන අතර අයවැය ප්‍රශ්නය විසඳා ගැනීමේ දී ද කෘෂිකර්මාන්තය වැදගත් වේ. මේ අනුව අපට අවසාන වශයෙන් නිගමනය කළහැකි වන්නේ අනිවාර්යයෙන්ම රටක් සංවර්ධනය කිරීමේ දී කෘෂිකාර්මික අංශය වර්ධනය කරගැනීම වැදගත්වන බවය. රටක් කාර්මික හෝ සේවා යන අංශ දෙකේම සංවර්ධනයන් ඇති කරගත්ත ද ආහාර අවශ්‍යතා සපුරාලීමට හැකිවන්නේ කෘෂිකාර්මික අංශයට පමණි. මේ නිසා ඕනෑම රටක් සංවර්ධන ඉලක්ක කරා

පියමනින විට කෘෂිකාර්මික අංශය වර්ධනය කරගත යුතු බව මින් වඩාත් පැහැදිලි වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

සෙනෙවිරත්න ලාල්, මුලික ආර්ථික ප්‍රශ්න , අනුල මුද්‍රණාලය, කොළඹ, 1968.

සෝමසුන්දර දයානන්ද ,කෘෂි ආර්ථික විද්‍යාව , ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන පාර, කොළඹ 10.

සේනානායක ,එස්.එම්.පී. , කෘෂිකාර්මික ආර්ථික විද්‍යාව, ප්‍රින්ට් ඇන්ඩ් ග්‍රැෆික්ස් ප්‍රයිවට් ලිමිටඩ්, අංක 06 , බෝධිරාජාරාම මාවත, මාලිගාවත්ත කොළඹ 10, 2008.

ආර්ථික විමසුම, දෙවැනි වෙළුම, 9 වන කලාපය, 1986 ජනවාරි

Johan W. Mellor, The economics of Agricultural Development New York.